# 2.23 ශ්‍රී ලංකාවේ ගුවන් විදුලිය කෙරෙහි එල්. සරත් පෙරේරා කමිටු වාර්තාව සිදුකරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්.

සමන් රාජපක්ෂ[1]
විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

## ABSTRACT

එක්දහස් නවසිය අනූව දශකය මැද භාගයෙන් පසුව විකල්ප මුහුණුවරින් යුත් පෞද්ගලික ගුවන් විදුලි නාලිකා රාශියක් ලාංකීය සමාජය තුළ බිහිවේ. මෙය ලාංකීය ගුවන් විදුලි ඉතිහාසයේ තීරණාත්මක සංධිස්ථානයකි. එතෙක් රාජ්‍ය ඒකාධිකාරය යටතේ පැවති ගුවන් විදුලිය පෞද්ගලික අංශයේ හිමිකාරිත්වයට නතුවීම ශ්‍රාවකයාගේ පැවැත්මට සහ ගුවන් විදුලි මාධ්‍යයේ අනාගත ක්‍රියාකාරිත්වය සඳහා දැඩි බලපෑමක් එල්ල කළේය. කෙසේ වෙතත් නව විකල්ප ධාරාවේ ගුවන් විදුලි නාලිකා විසින් මෙරට සාම්ප්‍රදායික ශ්‍රාවකත්වය තුළ විශාල පරිවර්තනයක් සිදුකළේය. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිංහල වැඩසටහන්හි තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා පත්කරන ලද එල්. සරත් පෙරේරා කමිටු වාර්තා අධ්‍යයනය කිරීම මඟින් පෞද්ගලික ගුවන් විදුලි නාලිකාවන්ගේ සීඝ්‍ර ව්‍යාප්තිය කෙරෙහි බලපෑ ඇතැම් සාධක හඳුනා ගත හැකිය. 1985 නොවැම්බර් මාසයේ ඉදිරිපත් කළ සරත් පෙරේරා කමිටුවේ නිර්දේශ සහ යෝජනා සම්බන්ධයෙන් එවක රාජ්‍ය ගුවන් විදුලි බලධාරීන් නිසි පරිදි අවධානය යොමුකළේ නම් ඇතැම් පෞද්ගලික ගුවන් විදුලි නාලිකාවන්ගේ ව්‍යසනකාරි හැසිරීම අවම වන්නට ඉඩ තිබුණි.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිංහල වැඩසටහන් හි එවක ස්වරූපය සහ ගුවන් විදුලියේ අභිවෘද්ධිය පිණිස අනාගතයේ දී එම වැඩසටහන් සහ ගුවන් විදුලියේ ආයතනික ව්‍යුහය වෙනස් වියයුතු ආකාරය පිළිබඳව කමිටු වාර්තාව මඟින් දීර්ඝ ලෙස පෙන්වා දී ඇත. අනාගතයේ දී ගුවන් විදුලි ග්‍රාහකත්වය තුළ සිදුවන පරිවර්තනයන් සහ ඊට මුහුණ දීම සඳහා රාජ්‍ය ගුවන් විදුලිය මඟින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්තීන් කමිටුව මඟින් අවධාරණය කොට ඇත. සරත් පෙරේරා කමිටුවේ යෝජනා ලාංකීය ගුවන් විදුලියේ අභිවෘද්ධිය සඳහා බලපෑවේ කෙසේ ද? යන්න මෙම අධ්‍යයනයේ ගැටළුවයි. සරත් පෙරේරා කමිටු යෝජනා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම ලාංකීය ගුවන් විදුලිය විවිධ අර්බුධ කරා මෙහෙයවා ඇත යන උපන්‍යාශය මත පිහිටමින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබීය. සම්මුඛ සාකච්ඡා සහ පුස්තකාල භාවිතය යනාදී ක්‍රමවේද ඔස්සේ අධ්‍යයනට අදාළ දත්ත රැස් කරනු ලැබීය.

**Key words :** ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, සිංහල වැඩසටහන්, කමිටු වාර්තා